විශේෂඥ වෛද්‍යවරුන් ගෙන් මේ සඳහා අයැදුම් පත් හා විස්තර ලබාගත හැකි මෙම වෙළඳ සේවයෙන් ඩොලර් 500 සිට 25000 දක්වා මූල්‍යමය ණය ලබා ගත හැකි ය. ඉදිරියේදී ඔබ විශේෂඥ වෛද්‍යවරුන්ගෙන් සේවය ලබා ගැනීමේදී GE Health Card රැගෙන ගියොත් විශේෂ වට්ටම්ද ලබාගත හැකි වනු ඇත. දැන් ඉතින් මොන ප්‍රශ්ණයක්ද? බෙහෙත් ගන්නට සල්ලි නැත්නම් පොලියට සල්ලි දෙන්නටත් සමාගම් ලෑස්ති වී ඉන්න විට කුමට බය වෙන්නද? ඉදිරි මැතිවරණයේදී ලිබරල් පක්ෂයේ ඡන්ද ව්‍යාපාරයට තවත් අනුග්‍රාහකයෙ-ක් හවඩ් රජයෙන් නිර්මාණය කර ඇත. ඉතින් අපට කිනම් සතුටක් ද?

මෙයට අවුරුදු නවයකට පෙර හවඩ් අගමැතිතුමා දැක්ක සිහිනය දැන් සැබෑ වෙමින් පවතී. ඇමෙරිකාවේ සෞඛ්‍ය ක්‍රමය දැන් අපේ රටේත්. සැබෑ සෞඛ්‍ය වියදමෙන් දෙගුණයක් වියදම. මන්ද වෛද්‍ය ක්ෂේත්‍රයේ වියදම් පියවීමට වෙස්සන්තර කොම්පැණි ඇවිත් සිටින නිසා ඉදිරියේදී උපත් අනුපාතය අඩු වීමට, මිනිසුන්ගේ මරණාසන්න වේදනාවන් වැඩි වීමට, දිගු ජීවිතකාලය කෙටි වීමට ඉහත සෞඛ්‍ය ප්‍රතිව්‍යුහගත කිරීම් කොයි තරම් අගනේ ද? ඉතින් අපට හැකි නම් සමහර තුන් වන ලෝකයේ රටවල ඇති මහජන සෞඛ්‍ය ක්‍රම ද විනාශ කිරීමට ප්‍රතිපාදන වෙන් කරමු.



Photo courtecy defendmedicare.info

මිනිසත් ක්‍රමය පුරා දුගඳ ගසා හමා යන වසල කුලය ප්‍රතිගාමීන් හා ධන කුවේරයන්ටත් වඩා ඉදිරියට පැමිණ ඇත. මිනිස් ජීවිතයක් උරුම කරගත් දින සිට අතීත පරපුර විසින් අපට උරුමකර දුන් අයිතිවාසිකම් වරප්‍රසාද භුක්ති විඳිමින් පෝෂණය වී එය වනසා දමන්නට ක්‍රියා කරන මේ නොමිනිසුන් මිනිස් කමටත් නිගාවකි. මිනිසා තිරිසනාගෙන් වෙන් වන්නේ වල්ගය නැති නිසාම නොව අන් වර්ගයා ගැන හද පත්ලෙන් උපදවන සෙනෙහස හා සහෝදරත්වය යන උත්තරීතර හැඟීම් ඔහුට ඇති නිසාවෙනි.

මේ සියළු නොපනත් කම් හමුවේ මිනිසුන් නිහඬ ය. මාටින් හිමොලර් ගේ කවියක් මගේ සිහියට එයි.

**ඔබත් මා වගේ නම්**

**එදා ජර්මනියේ නාසිවාදීන් පළමු**
**ඝාතනය කරනු ලැබුවා වූ කොමියුනිස්ට් වරුන් ය.**
**මා ඒ ගැන කිසිත් නොකියමි..**
**මන්ද මා කොමියුනිස්ට් වාදියකු නොවූ නිසාය.**
**ඉන් පසු**
**ඔවුන්ගේ ඉලක්කය වූයේ යුදෙව්වන් ය.**
**එවිට මා බසක් වත් නොකීවේ**
**මා යුදෙව්වකු නොවන හෙයිනි..**
**ඊළඟට ඔවුන්**
**වෘත්තීය සමිති ක්‍රියාකාරීන් මරා දැමූ හ.**
**මම නිකම් බලා සිටියෙමි..**
**මන්ද මා වෘත්තීය සමිතියකට බැඳී නැත.**
**ඔවුහු ඉන් පසුව**
**කතෝලිකයන් ඝාතනය කළහ.**
**මා කුමක් කියන්නද..**
**ඇයි මා ප්‍රොතෙස්තන්ත ආගමේ නොවේද..**
**අන්තිමට ඔවුන් පැමිණියේ මා වෙතය..**
**සැබැවින්ම එවිට මා වෙනුවෙන්**
**යුක්තිය කතා කිරීමට**
**කිසිවකු ඉතිරිව නොසිටිය හ..**

මේ කවිය අදට කොයි තරම් ගැලපේද.. ■

**මෙඩිකෙයා සංශෝධන පිලිබඳ වැඩි විස්තර මේ වෙබ් අඩවි වලින් ලබා ගත හැක**

**http://www.choice.com.au/viewArticle.aspx?id=103899&catId=100386&tid=100008&p=1**
**http://defendmedicare.info/index.htm**

# ඊ මේලයක තිබුණා මෙසේ..!!

ඊමේල ඔස්සේ බොහෝ වැදගත් සහ රසවත් දේ නිරන්තරයෙන් සංසරණය වෙයි. ඔබටත් එවන් ඊමේලයක් ලැබුණොත් සන්නසට එවන්න.
info@sannasa.net

Arthur Ashe, the legendary Wimbledon player was dying of CANCER. From world over, he received letters from his fans, one of which conveyed: "Why does GOD have to select you for such a fatal disease"?

To this Arthur, Ashe replied:

"The world over -- 5 billion children start playing tennis, 5 million learn to play tennis, 0.5 million learn professional tennis, 50,000 come to the circuit, 5000 reach the grand slam, 50 reach Wimbledon, 4 to semi final, 2 to the finals, When I was holding a cup I never asked GOD "Why me?". And today in pain I should not be asking GOD "Why me?""

**Happiness keeps u Sweet, Trials keep u Strong, Sorrow keeps u Human, Failure Keeps u Humble, Success keeps u glowing, but only God Keeps u going.**

**The way to love anything is to realize that it might be lost.**

I can win an argument on any topic, against any opponent. People know this, and steer clear of me at parties. Often, as a sign of their great respect, they don't even invite me.

**Dave Barry**

## මෙල්බන් සරසවිය
## සුනාමි විපතට පත් වූවන් සිහි කරයි


සේයාරුව මයිකල් සිල්වර්

මෙල්බන් සරසවියේ සිසුන් නිලධාරීන් තානාපතිවරුන් සහ විවිධ ආගම් වල නියෝජිතයන් සහභාගි වූ බහු ආගමික සිහිකිරීමේ උළෙලක් සුනාමි වපතට පත්වූවන් වෙනුවෙන් පසුගියදා පැවැතිවිණි.

නියෝජ්‍ය කුලපති (අධයයන) පීරේ මැක්නි මහතා සභාව ඇමතූ අතර සුනාමි වපත පිලිබඳව සිය කනගාටුව ප්‍රකාශ කළේය. සිහිකිරීමේ උළෙලට සහභාගි වූ සියල්ලන්ට ස්තුති කළ ඔහු විශේෂයෙන් කුලපති ඉයන් රෙනාඩ් සහ නියෝජ්‍ය කුලපති මහාචාර්ය ග්ලීස් ඩේවිස් ගේ ආදාරය පැසසුමට ලක් කළේ ය. සුනාමි වපතට පත් සියළුම රටවල් නියෝජනය කරමින් සිසුහු රෝස මලක් දැල්වෙන ඉටිපන්දම් අතරේ තැන්පත් කළහ. අනතුරුව ඉස්ලාම්, බෞද්ධ, ක්‍රිස්තියානි, හින්දු ආගමික නියෝජිතයෝ විශේෂ මෙහෙයන් පැවැත්වූහ. මෙහිදී ඔල්ගා හල්ගමුගේ මහත්මිය ශ්‍රී ලංකාව නියෝජනය කළාය.

අනතුරුව සියල්ලෝම අසළින් ගලා යන දිය කඩිත්තට රෝස පෙති විසුරුවා සුනාමි ව්‍යසනයෙන් විපතට පත් වූවන් සිහි කළහ.

**සටහන චම්පක මෙන්ඩිස්**